**IPRC/16/226**

# දේශීය ධනේශ්වර පංතියක් බිහිකරනු ලැබූ අරක්කු රේන්ද ව්‍යාපාරයේ 'භරත' (පරවර) සලකුණ.

ගංගා දිසානායක[1*]

ඉන්දීය සම්භවයක් සහිත ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ සිය ආර්ථික හා සමාජීය ස්ථාවරය ගොඩනගා ගත් පැරණි ජන කොටසක් ලෙස 'භරත' (පරවර) ජන කොටස හඳුනාගත හැකිය. ඔවුන් මීගමු භරත හා කොළඹ භරත ලෙස දෙකොටසකහිලා සැලකෙන අතර ඔවුන්ගේ ජනප්‍රවාදගත අතීතය කෝට්ටේ 6වන පරාක්‍රමබාහු රජසමය දක්වා දිවයයි. සංඛ්‍යාත්මකව ලක්ෂ 5ක් පමණ (2016) වන ජන සංගහණයක් සිටින භරත ජනතාව සිය ආර්ථිකය වෙළඳාම මුල්කර ගනිමින් ගොඩනගා ගත්හ. දේශීය ධනේෂ්වර පංතිය, බිහිවීමේ ආරම්භය හුවමාරු වෙළෙඳ ක්‍රමය අහෝසි වී යාමත් සමග ඇතිවූ අතර ආනයන අපනයන වෙළෙඳ ක්‍රමයක් වටා බිහිවූ දේශීය ව්‍යාපාරික පංතියක් ඉන් ජනිත විය. සමස්ත සේවා නියුක්තිකයන්ගෙන් 32% ක් වතු කම්කරුවන් වූ අතර ඔවුන් කේන්ද්‍ර කරගනිමින් බිහිවූ වෙළඳපල අවශ්‍යතා රටාවක් ලාංකේය සමාජය තුළ බිහිවිය. පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි යටත් විජිතයන්ගෙන් ලත් පුහුණුවෙන් භරත හා පහතරට වැසියෝ වෙළෙඳපළ ආර්ථිකයට යුහුසුළුව යොමුවූ අතර ඉංග්‍රීසි පාලන රටාව හරහා විවර වූ වෙළඳ අවස්ථා වහා ග්‍රහණයට ගත්හ. අරක්කු රේන්ද ව්‍යාපාරය ඒ අතර ප්‍රමුඛස්ථානයෙහි ලා ගැනෙන අතර 1911දී ලාංකේය තැබෑරුම් කරුවන්ගේ සංඛ්‍යාව 1561ක් විය. 1730 සිට 1900 දක්වා ලක්දිව ප්‍රධාන පෙළේ අරක්කු රේන්ද හිමිකරුවන් 20 දෙනෙක් අතුරින් 4 දෙනෙකු භරත ප්‍රජාවට අයත් වූ අතර සෙසු රේන්ද කරුවන්ගෙන් 25% ක අධිකාරයක් ඔවුන් සතුව තිබුණි. සර් ඩොනැටස් වික්ටෝරියා (වික්ටෝරියා වයින් ස්ටෝර්ස්) සතුව භරත ප්‍රජාව නියෝජනය කරනු ලබන විශාලතම සුරාසැල් ජාලය තිබූ අතර කොළඹ නගරය කේන්ද්‍ර කරගනිමින් එය ස්ථානගත කර තිබුණි. දෙවැන්න ඡඑගී.මිරැන්ඩාස් (මිරැන්ඩා වයින් ස්ටෝර්ස්) වන අතර වතු කම්කරුවන් ගේ අරක්කු වෙළඳපල ඉලක්ක කරගනිමින් යටියන්තොට/ බලන්ගොඩ/ ත්‍රිකුණාමලය/ අවිස්සාවේල්ල යන ස්ථාන ප්‍රධාන කරගනිමින් එම සුරාසැල් ජාලය පිහිටා තිබුණි. මෝතාස් හා කෝස්ටාස් අනෙකුත් හිමිකරුවන් වූ අතර දේශීය අරක්කු රේන්ද ව්‍යාපාරය තුළ ස්වදේශිකයන් හා කරට කර තරඟ කිරීමට මෙම ඉන්දීය කුඩා ජන කණ්ඩායමට හැකියාව තිබුනි. ග්‍රේබියල් ඩී කෘස් ප්‍රධාන ජෝන් ලියෝ ඩී කෘස්/ නිකලස් එම්මැනුවෙල් ඩී කෘස් යන මීගමු භරත ප්‍රජාව කටුනායක සිට කොච්චිකඩේ දක්වා වූ සුරාසැල් වල හිමිකාරිත්වය අත්පත්කර ගෙන තිබුනි. මේ හරහා උපයාගත් ධනය ඉඩම් හිමි දේශීය ධනේශ්වර පංතියක් බිහි වීමට හේතු සාධකයක් විය. එයින් ස්වදේශික ජනතාව හා සමානව ආර්ථික හා සමාජීය තත්ත්වයක් ලබාගැනීමට භරතී ප්‍රජාව සමත් වී තිබේ.අරක්කු රේන්ද හිමිකරුවන් පිළිබඳ මෙතෙක් කරන ලද පර්යේෂණ තුළින් භරත ප්‍රජාව ගිලිහී යාම හෝ ජනවර්ගයක් ලෙස ඒ සඳහා ඔවුන්ගෙන් වූ දායකත්වය නොසලකා හැරීම සිදුවූයේ මන්ද? යන්නත් අරක්කු රේන්ද කර්මාන්තය තුල භරත ප්‍රජාවගේ සමාජීය භූමිකාව පිළිබඳවත් මෙහිදී විස්තර කිරීමට නියමිතය.

***ප්‍රමුඛ පදඃ*** *භරත/ අරක්කු රේන්ද ව්‍යාපාරය /හුවමාරු වෙළෙඳපළ ක්‍රමය / ආනයන අපනයන ආර්ථිකය/ ඒකාධිකාරය*

[1] සමකථන ජර්යේෂණ ආයතනය, ශ්‍රී ලංකාව *gangarajinee@gmail.com